අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය
කොළඹ.

බිඑෆ්/එන්පිඑෆ්/01/2013 (68)

සියළුම ලැයිස්තු (ශ්‍රීලංනාහ හා ශ්‍රීලංගුහ හැර)

2013 දෙසැම්බර් 05

<u>මහජන මුදල් නොවන අරමුදල් ලෙස යුද්ධ හමුදා ආයතනයන්හි පවත්වාගෙන යන ගිණුම් තුලින් මුදල් කපාහැරීම</u>

යොමුව:

අ. බිඑෆ්/එන්පිඑෆ්/01/2013 (64) හා 2013.11.20 දිනැති අයවැය මුපඅම ලිපිය.

1. මෑතක සිට රෙජිමේන්තු අරමුදල් (මහජන අරමුදල් නොවන) වෙතින් සීමාව ඉක්මවා අධික ලෙස මුදල් වැයකර එම මුදල් ප්‍රමාණය ගිණුමෙන් කපාහැරීම (write off) සඳහා යුද්ධ හමුදාධිපති ආවරණ අනුමැතිය ලබාගැනිම පිණිස ඇතැම් ආරක්‍ෂක සේනා මූලස්ථාන, රෙජිමේන්තු මධ්‍යස්ථාන, පුහුණු මධ්‍යස්ථාන, ඒකක හා අනෙකුත් ආයතන වෙතින් අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිපි ඉදිරිපත් කිරීමේ ප්‍රවනතාවයක් වර්ධනය වී ඇති බැව් නිරීක්‍ෂණය වේ.

2. මහජන මුදල් නොවන අරමුදල් ඒ ඒ මුල/ඒකක මගින් පවත්වාගෙන යන ගිණුම් සඳහා මුදල් වැයකර ඒවා ගිණුමෙන් කපාහැරීමේ (write off) නව සීමාවන් යොමුගත ලිපිය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි එම අනුමත කාල සීමාවන් තුල එම අනුමත මුදල් කපාහැරීමේ සීමාව ඉක්මවා වැයකිරීම් සිදු නොකිරීමට සියළුම ආයතන ප්‍රධානින් විසින් වගබලා ගත යුතු බවට යුද්ධ හමුදාධිපති විසින් විධානය කර ඇත.

3. කෙසේ වෙතත් දැනට පවතින සාමකාමී වාතාවරණය හා හමුදා/සිවිල් සහයෝගිතා ක්‍රියාදාමය තුල ආරක්‍ෂක සේනා මූලස්ථාන වෙත පැවරී ඇති කාර්යභාරය අනුව යම් අවස්ථාවකදී ආරක්‍ෂක සේනා මූලස්ථාන වෙතින් යම් කාර්යයක් සඳහා එම අනුමත මුදල් සීමාවන් ඉක්මවා මුදල් වැයකිරීමට සිදුවන බව පෙනී යන්නේ නම් ඒ සඳහා යුද්ධ හමුදාධිපති පූර්ව අනුමැතිය ලබා ගැනිම සඳහා පහත දක්වා ඇති ක්‍රියා පිලිවෙත අනුගමනය කල යුතුය.

අ. හමුදාමය කාර්යයන් (Army events) හා වෙනත් හමුදා/සිවිල් සහයෝගිතා වැඩසටහන් සඳහා වෙන් වෙන් වශයෙන් අනුමැතිය ඉල්ලුම් කල යුතු වන අතර ඒවා එකට එකතුකර අනුමැතිය ඉල්ලුම් කිරීමෙන් වැලකී සිටිය යුතුය.

ආ. අදාල වැයකිරීම සිදුකිරීමට නියමිත දිනට අවම වශයෙන් දින 07 කට ප්‍රථම ඒ සඳහා අවශ්‍යතාවය විස්තරාත්මකව සාධාරණීකරණය සිදුකර ඇස්තමේන්තුව සමගින් ආඥාපති අත්සනින් යුතුව යුද්ධ හමුදාධිපති අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ක්‍රියාකල යුතුය.

ඇ. ඉතාමත් හදිසි නොවැලැක්විය හැකි හේතුවක් මත එසේ කල්වේලා ඇතිව යුද්ධ හමුදාධිපති අනුමැතිය සඳහා ඉදිරිපත්කිරීමට නොහැකි වන්නේ නම් එම අවශ්‍යතාවය පිලිබඳව ආඥාපති විසින් වාචික අනුමැතිය හෝ ලබා ගැනිමට ක්‍රියාකල යුතු අතර, ආවරණ අනුමැතිය සඳහා ලිපි ලේඛණ ඉදිරිපත්කිරීමේදී එම වාචික අනුමැතිය ලබාගත් යොමුවද එහි ඇතුලත් කර ඉදිරිපත් කල යුතුය.

4. ආසේමු හැර අනෙකුත් සියළුම මුලස්ථාන වෙතින් අනුමත මුදල් කපාහැරීමේ සීමාව ඉක්මවා මුදල් වියදම් කිරීමට සිදුවන බව පැහැදිලිව පෙනී යන අවස්ථාවන්හිදී පහත සඳහන් ක්‍රියාමාර්ග මුදල් වියදම් කිරීමට පෙර එම සියළුම ස්ථාන වෙතින් අනුගමනය කල යුතුය.

අ. මුදල් වැයකරන අවශ්‍යතාවය හා එසේ වැයකිරීමට තුඩු දෙන හේතුව පැහැදිලිව සාධාරණිකරණය (JUSTIFY) කර වියදම් කිරීමට අපේක්ෂිත මුදලට අදාලව සවිස්තරාත්මක ඇස්තමේන්තුවක් (DETAILED ESTIMATE) ආයතන ප්‍රධානිගේ අත්සනින් යුද්ධ හමුදාධිපතිගේ අනුමැතියට යොමු කිරීම පිණිස අයවැය හා මුපඅම වෙත ඉදිරිපත් කිරීම.

ආ. මුදල් වැයකිරීමට සිදුවන කාර්යය පැවැත්වීමට නියමිත දිනට දින 14 කට පෙර අදාල ලිපිය හා ඇස්තමේන්තුව අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

ඇ. අදාල ලිපිය, ඇස්තමේන්තු හා විස්තර ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් තනතුරු උසුලන නිලධාරීන් විසින් අදාල පරිදි එම ලියකියවිලි නිර්දේශ කල යුතු වේ.

(1) ශ්‍රීලංයුහසෙවබමු/1 වන රයිෆල් බලකාය/ 2 වන රයිෆල් බලකාය/පුරෝගාමී බලකාය - සේනාවිධායක ශ්‍රීලංයුහසෙවබමු

(2) ආසේමු/සේනාංක/බලසේනා මුලස්ථාන - අදාල ආරක්ෂක සේනා ආඥාපති

(3) හකාය අණසක - ආඥාපති

(4) යුද්ධ හමුදා පුහුණු පාසල් - ආඥාපති පුහුණු අණසක

(5) ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මුලස්ථානය - ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු

(6) ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානය - ප්‍රධාන සංඥා නිලධාරී

(7) ඉදිරි නඩත්තු පෙදෙස් - අදාල ඉදිරි නඩත්තු පෙදෙස් ආඥාපති

(8) ඒකක/බලඇණි/රෙජිමේන්තු මධ්‍යස්ථාන - අදාල රෙජිමේන්තු අධිපති/බලකාධිපති

(9) රණවිරු ඇපරල් ආයතනය/අභිමංසල/ රණවිරු සම්පත් කේන්ද්‍රය/මිහිඳු සෙත් මැදුර - අදාල සේනාවිධායක

(10) සෙනෙහස පර්යේෂණ තොරතුරු කේන්ද්‍රය - අධ්‍යක්ෂ

5. අනුමත සීමාවන් ඉක්මවා වැය නොදැරීමට අදාලව ස්ථාවර නියෝග/ලිඛිත උපදෙස් සියළුම ගිණුම්භාර නිලධාරීන් වෙත පැනවීමට ආයතන ප්‍රධානීන් විසින් පියවර ගතයුතු වේ. කිසිදු හේතුවක් මත ඉහත උපදෙස්වලට පටහැනිව රෙජිමේන්තු අරමුදල් මගින් මුදල් වැයකිරීම සිදුනොකල යුතු බව නැවත අවධාරණය කරනු ලැබේ.

ඩබ්ලිව්ජේසී ද සිල්වා ආර්ඩබ්ලිව්පී යූඑස්පී
මේජර් ජෙනරල්
මාණ්ඩලික ප්‍රධාන